ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී
උපාධි වැඩසටහන 2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
SNU5239/ESU3139 - අධ්‍යාපනයේ නව ප්‍රවණතා
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.01.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**<u>01 වන කොටස</u>**

01. "අධ්‍යාපනය යනු දරුවන්ගේ වරප්‍රසාදයක් නොවේ; එය ඔවුන්ගේ අයිතියකි."

    විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපන අයිතිය ආරක්ෂා කිරීම සඳහා සලකා බැලිය යුතු කරුණු පහක් (05) සඳහන් කරන්න.

02. ආබාධ සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කරන ජාත්‍යන්තර සම්මුතීන් අවම වශයෙන් තුනක් (03) වත් සඳහන් කර ඉන් එකක් (01) පැහැදිලි කරන්න.

03. ඒකීකරණ අධ්‍යාපනය සම්බන්ධයෙන් වන සුවිශේෂී තර්ක පහක් (05) ලැයිස්තුගත කරන්න.

04. ශ්‍රී ලංකාවේ ආබාධ සහිත දරුවන් සඳහා පවතින අධ්‍යාපන සේවාවන්හි ඇති අභියෝග පහක් (05) පැහැදිලි කරන්න.

05. තිරසර සංවර්ධන ඉලක්ක 2015-2030 හි ඉලක්ක අංක 04, කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ ආබාධ සහිත/ දරුවන් සඳහා නොවිධිමත් අධ්‍යාපනයේ ඇති වාසි පහක් (05) සඳහන් කරන්න.

07. විශේෂ අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය අතර ඇති ප්‍රධාන වෙනස්කම් පහක් (05) නම් කරන්න.

08. ආබාධ සහිත සිසුන්ට ඉගෙනීමේදී මාර්ගගත අධ්‍යාපනය උපකාරවන ආකාර පහක් (05) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05x08=40)

## 02- කොටස

09. (i.) උදාහරණ දක්වමින් අධ්‍යාපනයෙහි කාර්යබද්ධ පර්යාලෝකය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(ii.) ආබාධ සහිත දරුවන් සම්බන්ධයෙන්, පුද්ගල සංවර්ධනය සඳහා අධ්‍යාපනය යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) ශ්‍රී ලංකාව තුළ ආබාධ සහිත පුද්ගලයන් තම පුද්ගල සංවර්ධනයේදී මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i.) විධිමත් අධ්‍යාපනය යන්න උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) අවිධිමත් අධ්‍යාපන ක්‍රමය ආබාධ සහිත දරුවන්ගේ අධ්‍යාපනයට උපකාරවන්නේ කෙසේදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය සඳහා විධිමත් අධ්‍යාපන ක්‍රමයේ ඇති භාවිතයන් විස්තර කරන්න. (ලකුණු 08)

11. (i.) ආබාධ සහිත සිසුන්ගේ සන්දර්භය තුළ "විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii.) විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති දරුවන්ට සහාය වීම අරමුණු කරගත් උපාය මාර්ග හා ප්‍රතිපාදන වල සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන ඒකක ක්‍රමය, අන්තර්කරණ අධ්‍යාපනය වැඩිදියුණු කරගැනීමට දායක වන ආකාරය උදාහරණ සපයමින් විස්තර කරන්න. (ලකුණු 08)

12. (i.) "පූර්ණ අන්තර්කරණය" ඔබේ වචනවලින් නිර්වචනය කර උදාහරණයක් දක්වමින් එය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) ආබාධ සහිත දරුවන් සඳහා, පූර්ණ අන්තර්කරණ පිළිවෙත් හි වාසි සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii.) ශ්‍රී ලංකාව තුළ අන්තර්කරණ අධ්‍යාපනයට ප්‍රවේශ වීමේදී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් මුහුණ දෙන අභියෝග විස්තර කරන්න. (ලකුණු 08)

13. (i.) රජයන් විසින් "සැමට අධ්‍යාපනය" වෙනුවෙන් ඉලක්ක කල යුතු මානයන් සඳහන් කරන්න. (ලකුණු 05)

(ii.) ඉහත සඳහන් සැමට අධ්‍යාපන ඉලක්ක සපුරා ගැනීමේදී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය මුහුණ දෙන අභියෝග මොනවාද? විස්තර කරන්න. (ලකුණු 07)

(iii.) ශ්‍රී ලංකා රජය විසින් සැමට අධ්‍යාපන ඉලක්ක කෙතරම් දුරට ළඟා කරගෙන තිබේද යන්න තර්ක කරන්න. (ලකුණු 08)

14. (i.) "විශේෂ තත්ත්ව යටතේ ස්ථාන ගත කළ දරුවන්" මෙම යෙදුම විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) ආර්ථික අර්බුධ සහ ගෝලීය ගැටුම් විශේෂ තත්ත්ව යටතේ ස්ථානගත කල දරුවන්ගේ සංඛ්‍යාව ඉහල නැංවීමට හේතු වන ආකාරය සාකච්ඡා කරන්න. ඔබේ කරුණු විදහා දැක්වීම සඳහා නිශ්චිත උදාහරණ සපයන්න. (ලකුණු 08)

(iii.) ශ්‍රී ලංකාවේ විශේෂ තත්ත්ව යටතේ ස්ථාන ගත කල දරුවන්ගේ සංවර්ධනයට සහාය වීම සඳහා ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග මොනවාද? ඔබේ පැහැදිලි කිරීම සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 08)

***-සියලුම හිමිකම් ඇවිරිණි.-***